**සබරගමුව පළාත් සභාව - 2015**
**----------------------------------**

සබරගමුව පළාත් සභාවේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධි විධාන ප්‍රකාර, මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පළාත් සභා පනතේ 23(2) වගන්තිය ප්‍රකාර මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ. මෙහි ඇතුළත් විගණන නිරීක්ෂණ පිළිබඳව විස්තරාත්මක වාර්තාව පළාත් සභාවේ සභාගත කිරීම සඳහා යථා කාලයේ දී නිකුත් කරනු ලැබේ.

## 1.2 <u>මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම</u>

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරිම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 <u>විගණකගේ වගකීම</u>

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI - 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ.

එම අවදානම් තක්සේරු කිරීම් වල දී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් පළාත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට සබරගමුව පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 පළාත් සභා අරමුදල

සමාලෝචිත වර්ෂයේ පළාත් සභා අරමුදල් ගිණුම 2016 මාර්තු 30 දින විගණනයට ඉදිරිපත් කරන ලදී.

#### 2.2.2 අනෙකුත් ගිණුම්

සමාලෝචිත වර්ෂයට අදාලව 2016 ජුනි 15 දිනට පළාත් සභාවේ අනෙකුත් ගිණුම් ඉදිරිපත් කිරීමේ ප්‍රගතිය පහත දැක්වේ.

| | | මුළු ගිණුම් | ඉදිරිපත් කළ ගිණුම් සංඛ්‍යාව | ඉදිරිපත් නොකළ ගිණුම් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | විසර්ජන ගිණුම් | 27 | 27 | - |
| (ii) | ආදායම් ගිණුම් | 01 | 01 | - |
| (iii) | පළාත් රාජ්‍ය නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් | 24 | 23 | 01 |
| (iv) | වාණිජ අත්තිකාරම් ගිණුම් | 07 | 06 | 01 |
| (v) | අරමුදල් ගිණුම් | 02 | 02 | - |
| (vi) | ප්‍රඥප්ති ගිණුම් | 04 | 03 | 01 |
| (vii) | මන්ත්‍රී අත්තිකාරම් ගිණුම් | 02 | 02 | - |
| | | --- | --- | --- |
| | එකතුව | 67 | 64 | 03 |

#### 2.2.3 ගණකාධිකරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ප්‍රධාන අමාත්‍යාංශයේ තැන්පතු ගිණුමේ ශේෂය රු.32,399,078 ක් ලෙස දැක්වුවද, අදාල අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම අනුව තැන්පතු ගිණුමේ ශේෂය රු.27,014,035 ක් වුයෙන් රු.5,385,043 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ වාණිජ අත්තිකාරම් ගිණුම් 04 ක වාර්ෂිකව වෙනස් වෙමින් ඉදිරියට එන සීමාව ඉක්මවූ බැර ශේෂ එකතුව රු.14,387,855 ක් විය.

#### 2.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබු ලැබිය යුතු ගිණුම් ශේෂ වල වටිනාකම රු.6,528,191 ක් වු අතර, ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 658,586 ක් විය.

#### 2.2.5 පිළිතුරු නොළත් විගණන විමසුම්

2016 ජුනි 30 දින වන විට විගණන විමසුම් 68 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබු අතර,එකී විමසුම්වලට භාජනය වු ගණනය කළ හැකි ගණුදෙනුවල වටිනාකම රු.3,260,895,428 ක් විය.

**2.2.6 <u>නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම</u>**

පහත සඳහන් නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | මහ නගර සභා ආඥා පනතේ 252 අධිකාරයේ 226(5),(6) වගන්ති යටතේ ද, නගර සභා ආඥා පනතේ 255 අධිකාරයේ 183(5) වගන්තිය යටතේ ද, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (8),(9) වගන්තිය | විගණකාධිපතිවරයාගේ තීරණය දැනුම් දෙනු ලැබූ දින සිට දින 14 ක් ඇතුළත අධිභාරලාභියා විසින් පළාත් පාලන කොමසාරිස් වෙත අදාල මුදල ගෙවිය යුතු ය. එසේ මුදල් ගෙවා නොමැති නම් හා අභියාචනාවක් කර නොමැති නම් අදාල තැනැත්තා පදිංචි ප්‍රදේශයේ අධිකරණ බලය ඇති දිසා අධිකරණය වෙත ඉල්ලුම් කර නොමැති නම් අදාල තැනැත්තා පදිංචි ප්‍රදේශයේ අධිකරණ බලය ඇති දිසා අධිකරණය වෙත ඉල්ලීම් කර අදාල මුදල් අයකර ගැනීමට පළාත් පාලන කොමසාරිස් විසින් කටයුතු කළ යුතු ය. ඒ ආකාරයට කටයුතු නොකිරීම හේතුවෙන් විගණකාධිපති විසින් විවිධ අවස්ථාවන්හි දී සබරගමුව පළාතේ පළාත් පාලන ආයතනය 13 ක් සම්බන්ධයෙන් නිකුත් කළ අධිභාර සහතික වලින් සමාලෝචිත වර්ෂය අවසන් වන විට අධිභාර සහතික 21 ක් යටතේ එකතුව රු.2,204,716 ක ප්‍රමාණයක් අයවීමට තිබුණි. |
| (ආ) | 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 172(3) වගන්තිය පරිදි විගණකාධිපති විසින් නිකුත් කරන අධිභාර සහතික පිළිබඳව එම පනතේ 172(7) උප වගන්තිය | අභියාචනා ඉදිරිපත් කළ යුත්තේ මධ්‍යම රජයේ පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයේ ලේකම්වරයාට බව 2015 සැප්තැම්බර් 07 දින නීති පතිවරයාගේ පැහැදිලි කිරීම අනුව වැඩිදුරටත් තහවුරු වේ. එසේ වුවද, රු.123,857 ක් වටිනා අධිභාර සහතික 13 ක් සම්බන්ධයෙන් පළාත් සභාවේ විෂයය භාර අමාත්‍යතුමා වෙත ඉදිරිපත් කර කපා හැරීමට කටයුතු කර තිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආයතන සංග්‍රහය | |
| i. | I වැනි කාණ්ඩයේ II වැනි පරිච්ඡේදයේ 13.3 | පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ සහකාර ලේකම් සහ පරිපාලන නිලධාරි තනතුරු සඳහා වැඩ බැලීමේ පත්කිරීම් සිදුකර වසර 10 ක් ඉක්මවා තිබුණ ද පුරප්පාඩු පිරවීමට හෝ නිලධාරින් අතර රාජකාරි බෙදා දීමට කටයුතු කිරිමකින් හෝ තොරව තවදුරටත් වැඩ බැලීමේ වැටුප් මත මෙකී තනතුරු ක්‍රියාත්මක වන බව නිරීක්ෂණය විය. |
| ii | I වැනි කාණ්ඩයේ VII වැනි පරිච්ඡේදයේ 12:2:4 | පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ පරිපාලන නිලධාරි තනතුරෙහි නිත්‍ය නිලධාරිනිය, සහකාර ලේකම් තනතුරෙහි වැඩ බැලිම සඳහා පත් කිරිම හේතුවෙන් එම තනතුර පුරප්පාඩු වූ ලෙස සලකා එම තනතුරට වැඩ බැලීමේ වැටුප් මත නිලධාරියෙකු පත් කර 2005 සැප්තැම්බර් 01 දින සිට 2015 දෙසැම්බර් 31 දක්වා වූ කාල පරිච්ඡේදයට වැඩ බැලීමේ වැටුප් වශයෙන් රු.118,018 ක් ගෙවා තිබුණි. |

| | | |
|---|---|---|
| (ඈ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සබරගමුව පළාතේ පළාත් සභාවේ මුල්‍ය රීති සංග්‍රහයේ | |
| i. | 117.4 රීතිය | පළාත් සභාව වෙනුවෙන් එකතු කරනු ලබන මුදල් ප්‍රේෂණය කිරීමේ දී එම අවස්ථාව වන විට එකතු වී ඇති සම්පූර්ණ මුදලම ප්‍රේෂණය කළ යුතු වුවත්, රත්නපුර දිස්ත්‍රික්කය තුළ වූ ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ඊට පටහැනිව කටයුතු කිරීම හේතුවෙන් 2015 වසර අවසානයේ ඒ ඒ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි බැංකු ගිණුම්වල එකතුව රු.101,497,068 ක් ශේෂ වී තිබුණි. පළාතේ සංවර්ධනය වෙනුවෙන් යෙදවිය හැකි මුදල් කිසිදු පොලියක් රහිතව බැංකු ජංගම ගිණුම්වල වර්ෂය අවසානය තෙක් නිශ්කාර්යව පැවැතුණි. |
| ii. | 259.2 රීතිය | සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දින වන විට 2005 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා රු.62,012,807 ක් වූ අග්‍රිම ශේෂ 262 ක් පියවා නොතිබුණි. |
| (ඉ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ | |
| i. | මු.රෙ.571 | රත්නපුර කළාප අධ්‍යාපන කාර්යාලයේ වර්ෂ දෙකකට වැඩි එකතුව රු.874,865 ක් වූ පොදු තැන්පත් 9 ක් පැවති අතර ඒ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කෙරේ.<br>a. විගණන විමසුම් හා වෙනත් පරීක්ෂණමය හේතු මත පොදු තැන්පත් ගිණුමේ ශේෂ 07 ක එකතුව රු.349,282 ක් සම්බන්ධයෙන් සිදුකල යුතු පරීක්ෂණ වසර දෙකකටත් වඩා වැඩි කාලයක් ප්‍රමාද වී ඇති බව නිරීක්ෂණය විය.<br>b. ලිපිගොනුව නොලැබීමේ හේතුව මත විශ්‍රාමික නිළධාරියෙකුගේ විශ්‍රාම පාරිතෝෂික මුදල වූ රු. 512,083 ක් 2013 ජුනි 12 දින සිට පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.<br>c. ශිෂ්‍යයින් වෙත ගෙවීම් නොකර ආපසු එවා ඇති එකතුව රු. 13,500 ක් වූ ශිෂ්‍යාධාර මුදල් වසර දෙකකට වැඩි කාලයක් පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. |
| ii. | මු.රෙ.571.3 | සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ රු.1,287,393 ක් වටිනා තැන්පතු සම්බන්ධයෙන් විධිවිධාන පරිදි කටයුතු කර නොතිබුණි. |
| (ඊ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.12.1 මාර්ගෝපදේශය | ප්‍රධාන ලේකම් කාර්යාලයේ පුහුණු හා ධාරිතා සංවර්ධන වැය විෂයය මගින් රු.33,752,880 ක් වැයකර ආවරණ කූට් 1050 ක් මිල දී ගෙන තිබූ අතර ගුණාත්මකභාවය පිළිබඳව පරීක්ෂාවකින් තොරව ආවරන කූට් භාරගෙන අවමංගල්‍ය ආධාර හා වෙනත් සුභ සාධන සමිති වෙත බෙදා හැර තිබුණි. |

ඒ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය කෙරේ.

i. දෙවන අවම මිල සඳහන් ආවරණ කුටියේ ජලය කාන්දුවීම වැලැක්වීමට අමතර මුද්‍රාවන් යොදා තිබීම, අවම මිල ඉදිරිපත් කළ ලංසුකරු ප්‍රතික්ෂේප කිරීමට හේතුව වී තිබුණ ද මිල දී ගෙන තිබූ ආවරණ කුටිවල ද අමතර මුද්‍රා යොදා නොතිබූ අතර, අවම මිල නොසලකා හැරීම නිසා රු.2,856,000 ක පාඩුවක් සිදු වී තිබුණි.

ii. විෂය පිළිබඳ කුසලතාවයකින් යුතු තෙවන පාර්ශවයක් මගින් මෙම ආවරන කුටියක වටිනාකම රු.19,330 ක් ලෙස තක්සේරු කර තිබූ බැවින් සියලු ආවරණ කුටි සඳහා වැඩිපුර ගෙවූ මුදල රු.11,223,765 ක් බව නිරීක්ෂණය විය.

| | |
|---|---|
| (උ) ජනාධිපති කාර්යාලයේ සහ භාණ්ඩාගාරයේ එකඟත්වය මත නිකුත් කරන ලද 2001 මාර්තු 28 දිනැති අංක: මුදල් 01/2001 දරන පළාත් සභා සහ පළාත් පාලන චක්‍රලේඛය | |
| i. 3.1 ඡේදය | විවිධ පළාත් සභාවන් තුල ඒවායේ මන්ත්‍රීවරුන්ට ණය ලබා දීමට ක්‍රියාත්මක වන ණය යෝජනා ක්‍රමයන්හි පවතින වෙනස්කම් දුරලමින් ඒකාකාරී ක්‍රමයක් ඇති කර ගැනීම අරමුණු කර ගෙන ලබා දිය හැකි උපරිම ණය සීමාව රු.250,000 ක් ලෙස දක්වා තිබුණ ද, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය දැනුවත් කිරීමක් හෝ ඉන් උපදෙස් හෝ අදහස් විමසීමකින් තොරව 2012 නොවැම්බර් 07 සහ 2014 අප්‍රේල් 23 දිනැති සබරගමුව පළාත් සභාවේ අමාත්‍ය මණ්ඩල තීරණයක් මගින් එම සීමාව රු.672,000 දක්වා වැඩි කරගෙන තිබුණි. |
| ii. 3.2.7 උප ඡේදය ප්‍රකාරව එහි 3.2.1 සිට 3.2.4 දක්වා | කාර්යාලීය උපකරණ මිල දී ගැනීමට අදාල ආයතනයෙන් මිල කියුමක්(ඉන්වොයිසියක්) ඉදිරිපත්කර තිබිය යුතු අතර, ඉන්වොයිසියේ සඳහන් මුදල හෝ ණය සීමාව යන දෙකෙන් අඩු මුදල පමණක් ණය ලෙස ලබා දිය යුතු ය. නමුත් ඊට පටහැනිව සභා ලේකම් කාර්යාලය විසින් අවස්ථා 03 ක දී රු.300,262 ක ණය මුදල් ලබා දී තිබුණි. |
| iii. 2007 පෙබරවාරි 28 දිනැති අංක සීඑස්ඒ/පී1/40 දරන ජනාධිපති ලේකම්ගේ ලිපිය | a. අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා රාජ්‍ය ආයතන සිය රැස්වීම්, සම්මන්ත්‍රණ, වැඩමුළු ආදිය පැවැත්වීම සඳහා හෝටල් තෝරා නොගත යුතු අතර, දේශීය සංචාර වලදී ආහාර හා නවාතැන් වෙනුවෙන් ගෙවිය යුතු හෝටල් ගාස්තු රජයේ මුදලින් නිරවුල් නොකළ යුතු බව දක්වා තිබුණ ද එම විධිවිධානවලට පටහැනිව, |

| | | |
|---|---|---|
| | | පළාත් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 2015 වර්ෂයේ දී පවත්වන ලද සම්මේලන 03 ක් සඳහා එකතුව රු.1,113,693 ක් පෞද්ගලික හෝටල්වලට ගෙවා තිබුණි. |
| | | b. සභා ලේකම් කාර්යාලය විසින් 2013-2015 කාල පරිච්ඡේදය තුළ අවස්ථා 04 ක දී එකතුව රු.7,766,795 ක් පෞද්ගලික හෝටල්වලට ගෙවා තිබුණි. ප්‍රදේශයෙන් බැහැරව වැඩමුළු පැවැත්වීම හේතුවෙන් ඉන්ධන සඳහා රු.1,288,142 ක මුදලක් ද දෛනික දීමනා, ගමන් වියදම් හා කුලී රථ වියදම් සඳහා රු.64,258 ක් ද වශයෙන් එකතුව රු.1,352,400 ක අතිරේක වියදමක් දරා තිබුණි. සහභාගීවන්නන්ගේ සංඛ්‍යාව නිවැරදිව තහවුරු කර නොගැනීම නිසා අතිරික්ත කාමර කුලී සඳහා රු.2,675,487 ක් වැය කර තිබුණි. |
| (ඌ) | භාණ්ඩාගාර ලේකම්වරයාගේ 2015 ඔක්තෝබර් 02 දිනැති අංක 4/2015 දරන ජාතික අයවැය චක්‍රලේඛය | රජයේ සමාගම්, ව්‍යවස්ථාපිත මණ්ඩල ඇතුළු සියලුම රාජ්‍ය ආයතන විසින් මහජනතාවට, සේවකයන්ට සහ සේවය ලබා ගන්නා වෙනත් පාර්ශවයන්ට නොමිලයේ බෙදා හැරීමට මුද්‍රණය කරනු ලබන දින පොත් හා දින දර්ශන මුද්‍රණය 2016 වර්ෂයේ සිට නතර කරන ලෙස අමාත්‍ය මණ්ඩලය තීරණය කර ඇති බව දන්වා තිබුණි. නමුත් ඊට අනුකූළ නොවන ලෙස සබරගමුව පළාත් සභාව වෙනුවෙන් එහි සභා ලේකම් කාර්යාලය 2016 වර්ෂය සඳහා රු.1,127,636 ක වැය දරමින් කළමනාකරණ දින පොත් 2023 ක් හා රු.658,139 ක වැය දරමින් කුඩා දින පොත් 4198 ක් ද ලෙස එකතුව රු.1,785,775 ක දින පොත් මුද්‍රණය කිරිමට කටයුතු කර තිබුණි. |
| (එ) | 2012 ජනවාරි 05 දිනැති අංක 01/2012 දරන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශ චක්‍රලේඛය හා 2013 නොවැම්බර් 28 දිනැති හා අංක 7/2013 දරන අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛය හා මාර්ගෝපදේශ අත්පොතේ 11.3 වගන්තිය | i. පාසල් සංවර්ධන සමිතිය විසින් ලබා ගන්නා ලද ඉදිකිරීම් කාර්යයන් උප කොන්ත්‍රාත් වශයෙන් ලබා දිය නොහැකි බව දක්වා තිබුණ ද ර/ බලංගොඩ දාමහන මහා විද්‍යාලයේ පාසල් සංවර්ධන සමිතිය මඟින් අත්සන් කරන ලද රු.913,400 ක් වටිනා විද්‍යාගාර අලුත්වැඩියා කිරීම සහ ක්‍රීඩා පිටිය ඉහළ බැම්ම ඉදිකිරීමේ කර්මාන්ත උප කොන්ත්‍රාත් ලබා දී තිබුණි. |
| | | ii. පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් අටුළුගම අධ්‍යාපන සංවර්ධන පුහුණු මධ්‍යස්ථානයේ භූමි අලංකරණ කාර්යය වෙනුවෙන් රු.1,769,174 ක මුදලක් වැයකර තිබුණි. මෙම කාර්යය කෑ/දෙහි/අටුළුගම මායාදුන්න විද්‍යාලයේ පාසල් සංවර්ධන සමිතිය වෙත පවරා තිබූ අතර, මෙම කොන්ත්‍රාත්තුව ද ගිවිසුමකින් තොරව උප කොන්ත්‍රාත් දී ඉටුකරගෙන ඇති බව විගණනයේදී අනාවරණය විය. |

| | | |
|---|---|---|
| (ඒ) | 2010 මැයි 25 දිනැති අංක 4/2010 දරන විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ විශ්‍රාම වැටුප් චක්‍රලේඛය | ප්‍රවර්තන මාසයේ සේවකයන්ගෙන් අයකරනු ලබන දායක මුදල් හා රජයේ දායක මුදල් ඊළඟ මාසයේ 10 වෙනි දිනට පෙරාතුව රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ප්‍රේෂණය කළ යුතු වුවත් ආයතන 07 ක රු.302,031 ක මුදලක් තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. |
| (ඔ) | 2013 මැයි 22 දිනැති අංක 2013/23 දරන අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්වරයාගේ පාසල් වල පළමුවන ශ්‍රේණියට ළමුන් ඇතුළත් කිරීම පිළිබඳ චක්‍රලේඛයේ 18 වන වගන්තිය | 2015 වර්ෂයේ පළමු ශ්‍රේණියට අතුලත් කල එක් සිසුවෙකුගෙන් රු.4,200 බැගින් එකතුව රු.358,000 ක මුදලක් ර/හල්මිල්ලකැටිය විදුහලේ විදුහල්පතිවරයා විසින් දෙමාපිය නියෝජිතයකු මාර්ගයෙන් රැස් කර තිබුණි. |

**3.** **ආදායම් කළමනාකරණය**

**පසු ගිය වර්ෂ 05 ක ආදායමේ උපනතිය**

2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා පළාත් සභාව විසින් එකතු කරන ලද බදු ආදායම සහ බදු නොවන ආදායම පහත පරිදි වේ.

| වර්ෂය | බදු ආදායම | බදු නොවන ආදායම |
|---|---|---|
| | රු. | රු. |
| 2011 | 1,943,637,444 | 416,079,145 |
| 2012 | 2,007,749,583 | 496,404,402 |
| 2013 | 2,163,127,945 | 496,200,284 |
| 2014 | 2,394,497,364 | 676,362,034 |
| 2015 | 2,832,257,548 | 725,367,341 |

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ආදායම් ඇස්තමේන්තු සකස් කිරීමේ දී පසුගිය වර්ෂයේ තථ්‍ය ආදායම පිළිබඳව සැලකිල්ලක් නොදැක්වීම හේතුවෙන් ආදායම් ශීර්ෂ 09 ක රු.886,381,939 ක් අඩුවෙන් ඇස්තමේන්තු කර තිබුණි.

(ආ) පළාත් මුල්‍ය රීති 41.1.4 ප්‍රකාරව හැකිතාක් තාත්වික හා නිවැරදි ලෙස ඇස්තමේන්තු පිළියෙල කිරීමට කටයුතු කළ යුතු අතර, ණය හා අත්තිකාරම් පොලී ආදායම් ඇස්තමේන්තු කිරීමේ දී නිලධාරින්ගේ ශ්‍රේණි අනුව ලබා දි ඇති සහ නැවත ණය හා අත්තිකාරම් ගෙවීම් කලහැකි ප්‍රමාණයන් සැලකිල්ලට ගෙන සමාලෝචිත වර්ෂයේ වියහැකි තථ්‍ය හර ශේෂ මත පොලිය ගණනය කර ඇස්තමේන්තු පිළියෙල කළ හැකිව තිබුණි. එසේ වුවත්, කිසිදු පදනමකින් තොරව ඇස්තමේන්තු සකස් කර තිබු බව විගණනයේ දී නිරික්ෂණය විය.

(ඇ) සබරගමුව පළාතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 09 ක් විසින් විවිධ ආයතන වෙත බදු දී තිබු ඉඩම් වෙනුවෙන් 2015 දෙසැම්බර් 31 දිනට පැවති එකතුව රු.23,530,654 ක් වු දිගුකාලින බදු සහ දඩ මුදල් ද අරණායක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රු.43,442 ක් වු වාර්ෂික බදු සහ දඩ මුදල් ද හිඟව පැවති අතර, ඒ සම්බන්ධයෙන් 1996 අගෝස්තු 01 දිනැති අංක 96/05 දරණ ඉඩම් කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 07 වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. මීට අමතරව කුරුවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රු.563,019 ක් වු ජල බදු හා දඩ මුදල් ද අයවිය යුතුව තිබුණි.

## 4. මූල්‍ය සමාලෝචනය

### 4.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පළාත් සභා අරමුදලේ රු.238,561,212 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.1,415,104,004 ක් විය.

### 4.2 ආයතනයට එරෙහිව හෝ ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි

පළාත් සභාවේ අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු 13 කට එරෙහිව බාහිර පාර්ශවයන් විසින් පනවා තිබූ නෛතික සිද්ධි 129 ක් සහ අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු 06 ක් විසින් බාහිර පාර්ශවයන් වෙත පනවා තිබූ නෛතික සිද්ධි 07 ක් 2015 දෙසැම්බර් වන විටත් විභාග වෙමින් පැවැතුණි.

### 4.3 වියදම්වල අසාමාන්‍ය වැඩිවීම

සමාලෝචිත වර්ෂයේ තත්‍ය වියදම 2014 වර්ෂයේ තත්‍ය වියදම සමඟ සංසන්දනය කිරීමේදී සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වැය විෂයයකට අදාල තත්‍ය වියදම 2015 වර්ෂයේ වියදමට වඩා සියයට 64 කින් අසාමාන්‍ය ලෙස වැඩිවී තිබුණි.

## 5. අධිකාරි ගිණුම් / අරමුදල් ගිණුම්

(අ) මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

i. ආයතන සංග්‍රහයේ vi පරිච්ඡේදයේ 5.8 උප වගන්තිය ප්‍රකාරව උසස් කිරීමකින් පසුව වැටුප් වර්ධක ලබා දීමේ දී නව පත්වීම් දිනය වැටුප් වර්ධක දිනය විය යුතු අතර, වැටුප් වර්ධකයක් ලබා දීම සඳහා වර්ෂයක් ගත විය යුතු වුවත්, ඊට පටහැනි ලෙස නව පත්වීම් දිනය නොසලකා මාස 06 ක් ගත වූ පසු වැටුප් වර්ධක ලබා දී තිබුණි.

ii. 2014 වර්ෂයේ ප්‍රධාන සංවර්ධන ඉලක්කයන් ලෙස 2015 වර්ෂයේ මුල් මාස 06 ඇතුළත රියදුරු පුහුණු පාසලක් පිහිටුවීමට කටයුතු කිරීම, විදුහල්පතිවරයෙකු බඳවා ගැනීම හා බස් රථයක් මිල දී ගැනීම හඳුන්වා දී තිබුණි. එම ඉලක්කයන් 2015 වර්ෂයේ දී ඉටුකර නොතිබූ අතර, සබරගමුව මගී ප්‍රවාහන අධිකාරියේ නව සේවා ප්‍රඥප්තිය හඳුන්වා දීමට ද කටයුතු කර නොතිබුණි.

iii. සබරගමුව මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ හිටපු සභාපතිවරයෙකුට අයිති බස් රථ 05 ක් මගී ප්‍රවාහන බලපත්‍ර හා මාසිකව ලොග් පත්‍ර ලබා ගැනීමකින් තොරව ධාවනය කර තිබූ අතර, 2010 වර්ෂයේ සිට 2015 දෙසැම්බර් 31 දින දක්වා ඒ වෙනුවෙන් රු.1,001,600 ක මුදලක් අයකර ගෙන නොතිබුණි.

iv. මාස 02 සිට මාස 14 දක්වා කාල පරිච්ඡේදයක් මාසික ලොග් පත් ලබා නොගෙන බස් රථ 19 ක් ධාවනය කර තිබීමෙන් රු.168,000 ක් ද ධාවනය වන බස් රථ 12 කින් මාසික ලොග්පත් ගාස්තු රු.24,000 ක් ද අයවිය යුතුව තිබුණි.

v. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකුහට ක්ෂේත්‍ර පරීක්ෂණ සඳහා මසකට දින 04 ක් වෙනුවෙන් ඉන්ධන දීමනා සහ සංයුක්ත දීමනා ලෙස රු.15,000 බැගින් වර්ෂයකට රු.180,000 ක් ගෙවීම් කර තිබුණ ද අධීක්ෂණය කරන ලද ස්ථාන හා අධීක්ෂණ වාර්තා කිසිවක් ඉදිරිපත් කර නොතිබුණි.

vi. 2003 දෙසැම්බර් 02 දිනැති අංක 11/2003 දරන රාජ්‍ය සේවක අර්ථ සාධක අරමුදල් චක්‍රලේඛය පරිදි කොන්ත්‍රාත් පදනම මත සේවය කළ නිලධාරියෙකු සඳහා අර්ථසාධක අරමුදල් අය නොකිරීම හා ගෙවීම ප්‍රමාද වීම වෙනුවෙන් අධිභාර ලෙස රු.74,768 ක් සහ සේවකයාගෙන් අයකළ යුතු දායක මුදල් වශයෙන් රු.63,850 ක් අධිකාරියේ මුදලින් ගෙවා තිබුණි.

**(ආ) කර්මාන්ත සංවර්ධන අධිකාරිය**

**-----------------------------------**

සබරගමුව පළාත් සභාවේ 1990 අංක 04 දරන කර්මාන්ත සංවර්ධන අධිකාරිය ප්‍රඥප්තියේ 14 වැනි වගන්තියේ සඳහන් කාර්යයන් කිසිවක් අධිකාරිය ආරම්භයේ සිට 2016 වර්ෂය දක්වා වූ වසර 25 ක කාල සීමාව තුළ ඉටු කිරීමට අධිකාරිය අපොහොසත් වී තිබුණි. එසේ වුවද, පරිපාලන දීමනා හා අධ්‍යක්ෂ මණ්ඩල දීමනා ලෙස වාර්ෂිකව රු.600,000 කට වැඩි මුදලක් සභාපතිවරයා ඇතුළු කාර්ය මණ්ඩලය වෙත ගෙවා තිබුණි.

## 6. <u>මෙහෙයුම් සමාලෝචනය</u>

### 6.1 <u>ප්‍රධාන කාර්යයන්ට පටහැනි ක්‍රියාකාරකම්.</u>

ආණ්ඩුකාරවර ලේකම් කාර්යාලයේ 2015 වාර්ෂික ඇස්තමේන්තුව මඟින් 800-03-02-2401 වැය විෂය යටතේ පුහුණු හා ධාරිතා සංවර්ධනය සඳහා රු.5,000,000 ක ප්‍රතිපාදන සලසා තිබුණි. ප්‍රතිපාදන සැලසීමේ අරමුණට පටහැනිව 2015 වර්ෂය තුළ ඉන් රු.1,935,000 ක් වැය කරමින් පොත් මිල දී ගෙන පළාත තුළ දහම් පාසල්, පුස්තකාල, නගර සභා ඇතුළු ආයතන හා විවිධ පුද්ගලයින් වෙත බෙදා හැර තිබුණු අතර, වර්ෂය අවසාන වන විටත් මුළු ප්‍රතිපාදනයෙන් සියයට 61 ක ඉතිරියක් නිරීක්ෂණය විය.

### 6.2 <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පළාත් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 2015 වර්ෂය සඳහා ක්‍රීඩා භාණ්ඩ වර්ග 31 ක් මිල දී ගැනීම සඳහා මිල ගණන් කැඳවා තිබූ අතර, ඒ සම්බන්ධයෙන් වූ තාක්ෂණික ඇගයීම් වාර්තාව අනුව ක්‍රීඩා භාණ්ඩ වර්ග 13 ක් සඳහා කිසිදු හේතුවක් නොදක්වා අවම මිල ප්‍රතික්ෂේප කර මිල දී ගැනීම් සිදුකර තිබීමෙන් රු.1,031,375 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

(ආ) පළාත් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 2015 වර්ෂය තුල මිල දී ගෙන තිබූ එකතුව රු.1,146,220 ක් වන භාණ්ඩ වර්ග 12 ක් ද 2014 වර්ෂය තුළ මිල දී ගන්නා ලද භාණ්ඩ වර්ග 12 ක් ද 2016 ජුනි 08 වන විටත් ප්‍රයෝජනයට නොගෙන ගබඩා කර තිබුණි.

(ඇ) 2015 මාර්තු 27 දිනැති මුදල් කොමිෂන් සභා ලේකම් විසින් සබරගමුව පළාත් සභාවේ ප්‍රධාන ලේකම් අමතා තිබූ අංක FCBP/4/2/2015 දරන ලිපිය මඟින් 2015 සංවර්ධන සැලැස්මේ රු.මිලියන 25 ට අඩු කිසිදු ක්‍රියාකාරකමක් අදියර වශයෙන් වෙන් නොකළ යුතු බවට උපදෙස් ලබා දී තිබුණි. සබරගමුව පළාත් මාර්ග සංවර්ධනය, ග්‍රාමීය යටිතල පහසුකම් , සංචාරක සහ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය මගින් වැඩ වටිනාකම රු.107,838,347 ක් වූ ව්‍යාපෘති 75 ක් සඳහා උක්ත උපදෙස්වලට අනුකූල නොවන පරිදි අනුඥාව ලබා දී තිබුණි. මෙම ව්‍යාපෘති අදියර වශයෙන් වෙන් කිරීමකින් තොරව ව්‍යාපෘති 34 ක් ලෙස ඇස්තමේන්තු සකස් කර ක්‍රියාත්මක කිරීමේ හැකියාව පැවැති බව විගණනයේ දී නිරීක්ෂණය විය. ඇස්තමේන්තුගත මුළු වටිනාකමට තරඟකාරී මිල ගණන් කැඳවා ක්‍රියාත්මක කර නොතිබීම නිසා 2006 වර්ෂයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2(අ) සහ (ආ) පරිදි උසස් ගුණාත්මකභාවයක් හා අවම පිරිවැයක් සහිතව උපරිම ආර්ථික වාසි සලසා ගැනීමටත් සුදුසුකම්ලත් උනන්දුවක් දක්වන පාර්ශවයන්ට ප්‍රසම්පාදනයට සහභාගී වීම සඳහා සාධාරණ , සමාන හා උපරිම අවස්ථාවන් ලබා දීමේ අරමුණු ඉටු වී නොතිබුණි.

(ඈ) ඉඩම් කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් රු.502,775 ක් ගෙවීම් කර 2015 දෙසැම්බර් 23 දිනැතිව මිල දී ගන්නා ලද අමුණු ලෑලි 165 ක් වාගොල්ල දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථාන භූමියෙහි 2016 ජුනි 08 දින දක්වා මාස 05 ක කාලයක් නිෂ්කාර්යයව පැවැති බවටත් ඒවායේ දිග ප්‍රමාණයන් ඇණවුම් කරන ලද පිරිවිතර වලට අනුකූල නොවූ බවත් භෞතික පරීක්ෂාවේ දී නිරීක්ෂණය විය.

(ඉ) පොල්ගහලියැද්ද පිටවෙල්ල හා කුඹුරට ජලය ලබා ගැනීමේ වේල්ල සකස් කිරීම හා එම ව්‍යාපෘතියේ දෙවන කොටස යන ව්‍යාපෘති රු.886,603 ක ගිවිසුම්ගත වටිනාකමට ක්‍රියාත්මක වී තිබුණු අතර, මෙම ව්‍යාපෘතිය මඟින් සාධ්‍යතා වාර්තාවේ සඳහන් අරමුණු ඉටු නොවන බව නිරීක්ෂණය විය. ව්‍යාපෘති දෙක මඟින් ඉදිකර තිබුණේ එකම පැති බැම්මක කොටස් දෙකක් වුවද, එක් බැම්මක පළල අනවශ්‍ය පරිදි විශාල කර තිබීමෙන් පළමු ව්‍යාපෘතිය අධි ඇස්තමේන්තුගත වී ඇති බවටත් ඒ හේතුවෙන් රු.92,578 ක් වැඩිපුර දරා ඇති බවටත් නිරීක්ෂණය විය.

## 6.3 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පදිංචියට සුදුසු නිවසක් නොමැතිවීම මත නිවාසගත ළමුන් යළිත් සිය පවුල් ඒකක වෙත භාරදීම හා එම කරුණ මත නිවාස ගත කිරීමට අපේක්ෂිත දරුවන් සිය පවුල් ඒකක තුලම රඳවීම යන අරමුණු මත ක්‍රියාත්මක කරනු ලබන "යළිත් නිවස වෙත" හා "නිවාස ගත වීම වැලැක්වීම" යන තේමාවන් මුල් කරගත් නිවාස ව්‍යාපෘතිය මේ වනවිට වසර 8ක කාලයක් ක්‍රියාත්මක කර තිබූ අතර, රු.1,867,840 ක් වැයකර ප්‍රතිලාභීන් 15 දෙනෙකු සඳහා ප්‍රතිලාභ ලබා දී තිබුණි. මේ සම්බන්ධයෙන් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ආකාරය පිළිබඳ තොරතුරු ඇතුළත් ව්‍යාපෘති වාර්තාවක් හෝ අනුමත වැඩසටහන් සැලැස්මක් සකස් කර නොතිබුණි. සැලැසුම් සකස් කිරීමේ දී පැවැති දුර්වලතා හේතුවෙන් පවුල් ඒකක වෙත අරමුදල් වෙන් කිරීමේ විෂමතාවයක් නිරීක්ෂණය වූ අතර, ඉදිකර තිබුණු නිවාස වල නිශ්චිත ප්‍රමිතියක් ද නොවීය. ව්‍යාපෘතියෙහි සාර්ථකත්වය මුළුමනින්ම අදාල පරිවාස නිළධාරියාගේ කැපවීම හා කාර්යක්ෂමතාවය මත තීරණය වී තිබුණු අතර, දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශ මට්ටමින් අධීක්ෂණය ද ඉතා දුර්වල මට්ටමක පැවැතුණි.

i. පැල්මඩුල්ල පරිවාස කාර්යාලයේ ස්ථානභාර පරිවාස නිළධාරි විසින් එම ප්‍රදේශයේ දරුවකු නිවාස ගතවීම වැලැක්වීම සඳහා එම දරුවාගේ පවුල් ඒකකය වෙත නිවසක් ඉදිකර දීමට රු.150,000 ක මූලික ඇස්තමේන්තුවක් හා පසුව රු.75,000 ක අතිරේක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබුණි. ඒ අනුව 2015 ජුනි, අගෝස්තු හා සැප්තැම්බර් යන මාස වලදී වරකට රු.75,000 බැගින් එකතුව රු.225,000 ක් අත්තිකාරම් මුදල් ලබාගෙන තිබූ අතර, 2015 දෙසැම්බර් 31 දින වනවිට අත්තිකාරම් පියවීම සඳහා රු.224,800 ක බිල්පත් ඉදිරිපත් කර නිවස ඉදිකර භාරදුන් බවට ඡායාරූප සහිතව වාර්තාකර තිබුණි. එහෙත් 2016 පෙබරවාරි 29 දින සිදුකරන ලද ස්ථානීය පරීක්ෂාවේදී එවැනි නිවසක් ඉදිකර නොතිබූ බවත් ඉදිරිපත් කර තිබූ රු.149,800 ක් වූ බිල්පත් ව්‍යාජ ඒවා බවත් වැඩිදුරටත් නිරීක්ෂණය විය.

ii. රත්නපුර පරිවාස කාර්යාලය මඟින් එම බල ප්‍රදේශයේ දරුවකු නිවාසගතවීම වැලැක්වීම සඳහා රු.75,000 ක මුදලක් වැය කරමින් අඩි 21'x16' ප්‍රමාණයේ සම්පූර්ණ කාමරයක් ඉදිකරදීමට සැලසුම් කර වියදම් දරා තිබුණද 2016 මාර්තු 01 දින සිදුකරන ලද ස්ථානීය පරීක්ෂාවේදී සැලසුම් කර තිබූ ආකාරයේ කාමරයක් අලුතින් ඉදිකර නොතිබුණි.

(ආ) හෙක්ටයාර් 5.432 ක් වූ කිතුල්ගල දිසා රෝහල් ඉඩම සඳහා ස්ථිර ආරක්ෂිත වැටක් ඉදිකර නොතිබූ අතර, හෙක්ටයාර් 0.470 ක ප්‍රමාණයක අනවසරයෙන් ස්ථිර ගොඩනැඟිලි ඉදිකර පදිංචිව ඇතත් එය නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8:12:3 ප්‍රකාරව සපයන ලද භාණ්ඩ නියමිත පිරිවිතරයන් හා වෙනත් එකඟ වූ නියමයන්ට අදාල විය යුතු අතර, ඒ සම්බන්ධයෙන් තාක්ෂණික දැනුමක් ඇති පුද්ගලයෙකු විසින් අදාල නිර්දේශ ලබාදිය යුතු වුවද, පළාත් පාලන කොමසාරිස් කාර්යාලයේ රු.361,200 ක් වටිනා පරිගණක යන්ත්‍ර 05 ක් මිල දී ගැනීම් සම්බන්ධයෙන් එසේ සිදුකර නොතිබුණි.

**6.4** <u>මතභේදයට තුඩුදෙන ගණුදෙනු</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) i. ප්‍රධාන ලේකම් කාර්යාලයේ 2014 වර්ෂයේ ප්‍රාදේශීය සංවර්ධන සැලැස්ම යටතේ පුහුණු හා ධාරිතා සංවර්ධනය සඳහා වෙන්කර තිබූ ප්‍රතිපාදන වලින් රු. 6,321,700 ක් 2014 දෙසැම්බර් 31 දින පළාත් සභාවේ ගරු මන්ත්‍රීවරුන් 44 දෙනා වෙත ලැප්ටොප් පරිගණක 04 ක්, ටැබ් පරිගණක 13 ක් හා ජංගම දුරකථන 27 ක් ලබා දීම සඳහා වැය කර තිබුණි. වෙන්කර තිබූ ප්‍රතිපාදන අරමුණුගත නොවන කාර්යයක් සඳහා වැයකර ඇති බව නිරීක්ෂණය වූ අතර මිලදී ගෙන තිබූ උපකරණ කිසිදු කොන්දේසියකින් තොරව අදාල මන්ත්‍රීවරුන් වෙත නිකුත් කර තිබුණි.

ii. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධි විධාන ප්‍රකාරව පිරිවිතර තුළ ඒවායේ වෙළඳ නාමය සඳහන් නොවිය යුතු වුවත්, ටැබ් පරිගණක 13 හා ජංගම දුරකථන 27 මිලදී ගැනීමේදී එකී විධිවිධානයන්ට පටහැනිව කටයුතු කර තිබුණි.

(ආ) පළාත් සභා උපමාන පාදක අරමුදල් යටතේ ඇලපාත, කහවත්ත හා කළවාන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ වල අඩු ආදායම්ලාභි පවුල් වල දරුවන් වෙත බෙදාදීම සඳහා අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් එකතුව රු. 1,176,457 ක් වැය කරමින් අභ්‍යාස පොත් 54,719 ක් 2014 දෙසැම්බර් මස මිලදී ගෙන තිබුණි. මෙම අභ්‍යාස පොත් මුද්‍රණයේදී අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල ඇණවුමට පටහැනිව දේශපාලන අධිකාරියේ ඡායා රූප ඇතුළත් කර පිටකවරය මුද්‍රණය කර තිබීම නිසා රත්නපුර දිස්ත්‍රික් ලේකම්වරයා එම පොත් ප්‍රාදේශිය ලේකම්වරයා කාර්යාල මඟින් බෙදාදීම ප්‍රතික්ෂේප කර පළාත් සභාවේ සභා ලේකම්වරයා වෙත 2015 අප්‍රේල් මස භාර දී තිබුණි. මෙම සියළුම පොත් 2016 ජුනි 15 දින වන විටත් පළාත් සභාවේ ගබඩා කර තිබූ බව විගණනයේ දි අනාවරණය විය.

(ඇ) රත්නපුර දිස්ත්‍රික්කයේ සියළුම යෞවන සමාජ වල සිටින ක්‍රීඩක ක්‍රීඩිකාවන් තෝරා ගෙන ඔවුන්ට ක්‍රිකට් හා වොලිබෝල් කට්ටල ලබා දීමට සැලසුම් කරමින් රු.1,724,530 ක් වැය කර ක්‍රීඩා භාණ්ඩ කට්ටල 575 ක් 2014 දෙසැම්බර් 31 දින මිලදී ගෙන තිබුණි. නමුත් මිලදී ගත් ක්‍රීඩා භාණ්ඩ නියමිත ප්‍රමිතීන්ට අනුකූල බවට තාක්ෂණික ඇගයීම් කමිටු නිළධාරීන් විසින් පරීක්ෂා කර නොතිබුණි. ප්‍රධාන අමාත්‍යාංශය විසින් ක්‍රීඩා භාණ්ඩ බෙදා දීමේ කටයුතු සැලසුම් කොට ක්‍රීඩා සමාජ වලට බෙදා දීම වෙනුවට භාරගත් භාණ්ඩ වලින් රු.1,466,880 ක් වටිනා භාණ්ඩ පළාත් සභා මන්ත්‍රීවරයකු වෙත භාර දී තිබුණි. එම ක්‍රීඩා භාණ්ඩ අදාල මන්ත්‍රීවරයාගේ නිවසේ ගබඩා කර තිබූ අතර ඉන් කිසිවක් 2016 මාර්තු 01 දින වන විටත් බෙදා දී නොතිබූ බවත් ප්‍රධාන අමාත්‍යාංශයේ ගබඩාවේ රු. 22,750 ක් වටිනා වොලිබෝල් 07 ක් හා අදාල මන්ත්‍රීවරයාගේ නිවසේ ගබඩා කර තිබූ රු.14,940 ක් වටිනා වොලිබෝල් නෙට් 06 ක ඌණතාවයක් පැවති බව විගණන පරීක්ෂාවේ දි අනාවරණය විය.

(ඈ) සමාජ සුබසාධන, පරිවාස හා ළමා රක්ෂක ග්‍රාම සංවර්ධන සහ ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යතුමාට ලන්ඩනයේ පෞද්ගලික ආයතනයකින් ලද පෞද්ගලික ආරාධනාවක් වෙනුවෙන් 2015 නොවැම්බර් 07 දින සිට 17 දින දක්වා එක්සත් රාජධානියේ සංචාරය කිරීම සඳහා ගුවන් ටිකට්පත් ගාස්තු, අනියම් දීමනා හා සංයුක්ත දීමනා වශයෙන් එකතුව රු.1,305,501 ක් පළාත් සභා අරමුදලින් ගෙවීම් කර තිබුණි.

(ඉ) පළාත් අධ්‍යාපන තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය මඟින් පළාත් සභාවට අයත් සංස්කෘතික නිළධාරීන් හා මධ්‍යම රජයේ සංස්කෘතික නිළධාරීන්ද සම්බන්ධ කර ගෙන 2015 වර්ෂයට ක්‍රියාත්මක සැලැස්මක් සකස් කිරීමට හා නිළධාරීන්ට පුහුණුවක් ලබාදීමටත්, ප්‍රසම්පාදන හා ඇගයීම කමිටු සාමාජිකයින් සඳහා නේවාසික වැඩමුළුවක් පැවැත්වීමටත් තීරණය කර තිබුණි. ඒ අනුව 2014 දෙසැම්බර් මස 21 හා 22 දිනවල නුවරඑළිය නිවාඩු නිකේතනයකදී නේවාසික පුහුණු වැඩමුළුවක් පවත්වා ඒ වෙනුවෙන් රු.176,411 ක වියදමක් දරා තිබුණි. සංස්කෘතික නිළධාරී වැඩමුළුවේ මූලික අරමුණ වූ 2015 වර්ෂය සඳහා ක්‍රියාත්මක සැලැස්මක් සකස් කිරීම වුවත්, 2015 වර්ෂය අවසන් වන තුරුම එවැන්නක් සකස් කර නොතිබුණි.

(ඊ) අධ්‍යාපන තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යවරයාට, අමාත්‍යාංශ ලේකම්වරයාට හා සබරගමුව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයාට 2015 දෙසැම්බර් 01 සිට දෙසැම්බර් 06 දක්වා ඉන්දියාවේ පැවැත්වුනු ජාත්‍යන්තර සිසු තත්ත්ව කව සම්මන්ත්‍රණයට සහභාගි වීම සඳහා ගුවන් ටිකට්පත් ගාස්තු, අනියම් දීමනා හා සංයුක්ත දීමනා සහ වීසා ගාස්තු වශයෙන් එකතුව රු.1,016,157 ක් ගෙවා තිබුණි. මෙම විදෙස් සංචාරය සඳහා නියෝජිත ආයතනය විසින් ආහාර පාන හා නවාතැන් පහසුකම් ලබා දෙන බව ඇරයුමේ සඳහන් කර තිබියදී 2015 මැයි 15 දිනැති අංක මු.අ. 01/2015/01 දරන මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛයේ විධිවිධානවලට පටහැනිව පළාත් අධ්‍යාපන අමාත්‍යවරයා හා ඔහුගේ පෞද්ගලික ලේකම් වරයා රු.539,997 ක සංයුක්ත දීමනා ලබාගෙන තිබුණි.

(උ) පළාත් සභා ලේකම් කාර්යාලයට වෙන් කරන ලද පුනරාවර්තන ප්‍රතිපාදන වලින් රු.4,241,646 ක් වැයකර ජංගම දුරකථන 70 ක්, ඩිජිටල් කැමරා 105 ක්, රැහැන් රහිත දුරකථන 40 ක්, ප්ලේයර් 68 ක්, සහ ෆැක්ස් යන්ත්‍ර 45 ක් මිල දී ගෙන සභාපතිවරයාගේ තිළිණ වශයෙන් පළාත් සභාවේ මැති ඇමතිවරුන්ට, මන්ත්‍රීවරුන්ට, සභා ලේකම් කාර්යාලයේ කාර්යය මණ්ඩලයට, ප්‍රධාන ලේකම් කාර්යාලයේ මාණ්ඩලික නිලධාරින්ට සහ මාධ්‍යවේදීන්ට 2013,2014 සහ 2015 යන වර්ෂයන්හි දී බෙදා හැර තිබුණි.

## 6.5 දෘශ්‍ය වංචනික ගණුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පාසල් අධ්‍යාපන පද්ධතිය දැනුම් කේන්ද්‍රයේ පදනම ලෙස පරිනාමනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ලෝක බැංකු ප්‍රතිපාදන වලින් රු.14,329,900 ක් වැයකර පරිගණක 151 ක් මිලදී ගෙන බෙදාහැර තිබුණි. එයින් පරිගණක 50ක් පිළිබඳව භෞතික පරීක්ෂා කිරීමේදී එම පරිගණක මිලදීගැනීම සඳහා සකස් කර තිබුණු පිරිවිතර අනුව සැපයිය යුතුව තිබූ බාහිර ස්පීකර් දෙක හා මවුස් පෑඩ් එකම පරිගණකයක් සඳහාවත් ලබා දී නොතිබූ බව නිරීක්ෂණය විය. මීට අමතරව පරිගණක කිහිපයක HDMI උපාංගය නොතිබූ බවත්, මෙහෙයුම් පද්ධතියේ අඩුපාඩු ඇති බවත් විගණනයේදී නිරීක්ෂණය විය. එසේ වුවත්, පිරිවිතර අනුව පරිගණක සමන්විත බවත්, ඔවුන් විසින් ඒවා පරීක්ෂා කළ බවත් තාක්ෂණික ඇගයීම් කමිටු නිළධාරීන් විසින් ව්‍යාජ තහවුරු කිරීමේ ලේඛනයක් ලබාදී නියමිත පිරිවිතරයන්ට අනුකූල නොවූ භාණ්ඩ සඳහා මුදල් ගෙවීමට අවස්ථාව සලසා දි තිබුණි.

(ආ) ර/හල්මිල්ලකැටිය මහා විද්‍යාලයේ පාසල් සංවර්ධන ගිණුමේ රු.220,434 ක් වටිනා චෙක්පතක් විදුහල්පතිවරයාගේ පෞද්ගලික ගිණුමෙහි 2015 දෙසැම්බර් 16 දින තැන්පත් කර තිබුණි.

## 6.6 අරමුදල් ඌන උපයෝජනය

කෑගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පළාත් සභාවෙන් ලබාගත් අග්‍රිමවලින් රු.9,996,097 ක මුදලක් සමාලෝචිත වර්ෂය තුලදී ප්‍රයෝජනයට නොගෙන 2015 දෙසැම්බර් 31 දින ආපසු ප්‍රධාන ලේකම් වෙත පියවා තිබුණි.

## 6.7 නිෂ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්

පළාත් සභාවට අයත් විවිධ ආයතනයන්හි භෞතික සම්පත් නිෂ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| | වත්කම් ස්වභාවය | සංඛ්‍යාව | වටිනාකම රු. | නිෂ්ක්‍රීයව පැවති කාලය |
|---|---|---|---|---|
| (අ) | ඉඩම් | 12 | සඳහන් නොවේ. | අවුරුදු 10 |
| (ආ) | ගොඩනැගිලි | 12 | සඳහන් නොවේ. | අවුරුදු 10 |
| (ඇ) | වාහන | 01 | සඳහන් නොවේ. | අවුරුදු 03 |
| (ඈ) | යන්ත්‍රෝපකරණ | 02 | 209,886 | අවුරුදු 15 |
| (ඉ) | වෙනත් | 31 | 1,599,670 | අවුරුදු 1-2 දක්වා |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) බෙලිහුල්ඔය හරහා ගමන් ගන්නා සංචාරකයන්ට ආහාර පාන ලබා ගැනීමේ පහසුකම්, තොරතුරු ලබා ගැනීමේ පහසුකම් හා සනීපාරක්ෂක පහසුකම් සැලැස්වීම අරමුණු කරගෙන රු.7,990,260 ක පිරිවැයක් දරා 2015 පෙබරවාරි 15 වැඩ නිමකර තිබුණු බෙලිහුල්ඔය සංචාරක මධ්‍යස්ථානය වසරකට අධික කාලයක් මහජන ප්‍රයෝජනය සඳහා යොදවාගෙන නොතිබුණි.

(ආ) මාවනැල්ල අධ්‍යාපන කලාපයේ වැසී ගිය පාසල් 35 ක් අතරින් දීර්ඝ කාලයක සිට වසා දමා ඇති පාසල් 11 ක වත්කම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට භාර දීමට පියවර ගෙන නොතිබුණි.

(ඇ) සබරගමුව පළාත් අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශ ප්‍රතිපාදන මත රු.8,389,605 ක් වැය කර ර/බල/උඩගම මහා විද්‍යාලයේ ඉදිකළ මහින්දෝදය තාක්ෂණික විද්‍යාගාරය 2015 අප්‍රේල් 06 දින සිසු අයිතියට පත් කර තිබු නමුත් තෙකලා විදුලි සැපයුම නොතිබිමෙන් විද්‍යාගාරයේ පරිගණක යන්ත්‍ර 41 ම ක්‍රියාත්මක කිරිමට නොහැකිව ඌන උපයෝජිතව පැවැතුණි. භාෂා විද්‍යාගාරය සඳහා රු.2,050,000 ක් වැය කර මිල දී ගන්නා ලද පරිගණක යන්ත්‍ර 20 ක් හා අඛණ්ඩ බල සැපයුම් පද්ධති ( UPS) 20 ක් ප්‍රයෝජනයට නොගෙන ඇසුරුම් වලම තිබු අතර, ඒවායේ වගකීම් කාලය ද ඉක්ම ගොස් තිබුණි.

(ඈ) කරවනැල්ල රෝහලේ බාහිර රෝගී අංශය සහ සායන කටයුතු පරිගණක ජාලගත කිරිම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික ආයතන විසින් 2013 දෙසැම්බර් 30 දින ලබා දී තිබු ලැප්ටොප් පරිගණක 20 ක් 2015 දෙසැම්බර් 30 දක්වාත් ප්‍රයෝජනයට ගෙන නොතිබු අතර, පරිගණක වල වගකීම් කාලය ද ඉක්ම ගොස් තිබුණි.

(ඉ) කරවනැල්ල රෝහල් පරිශ්‍රයේ වර්ග අඩි 900 ක ප්‍රමාණයක් දැඩි සත්කාර ඒකකයක් සඳහා වෙන් කර, රු.මිලියන 04 ක පමණ වටිනාකමැති උපකරණ 2012 ජුනි මාසයේ දී ලබා දී තිබුණ ද අවශ්‍ය කාර්ය මණ්ඩලය ලබා නොදීමෙන් 2015 දෙසැම්බර් 30 දක්වාත් එම ඒකකය ආරම්භ කර නොතිබුණි.

(ඊ) පළාත් නිශ්චිත කාර්ය සංවර්ධන ප්‍රදාන යටතේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාල විසින් ක්‍රියාත්මක කරනු ලබන ක්ෂේත්‍ර වැඩසටහන් අධීක්ෂණය කිරීම අරමුණු කර ගෙන GPS උපකරණ 17 ක් හා සිතියම් මිල දී ගැනීම සඳහා රු.974,000 ක් 2012 හා 2014 වර්ෂයන් හිදි වැය කර ඇතත්, ව්‍යාපෘතිය ආරම්භ නොකිරීම හේතුවෙන් 2015 ජුලි මාසය දක්වාත් මෙම උපකරණ නිශ්කාර්යව පැවැතුණි.

**6.8** <u>හඳුනා ගන්නා ලද පාඩු</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මාවනැල්ල අධ්‍යාපන කලාපයේ දුෂ්කර පාසල් 06 ක සේවය කළ ගුරු භවතුන් 07 දෙනෙකු එම පාසල් වලින් ස්ථාන මාරු කිරීමෙන් හා වෙනත් පාසල්වලට අනුයුක්ත කිරීමෙන් පසුවත් දුෂ්කර දීමනා වශයෙන් රු.73,417 ක මුදලක් ගෙවා තිබුණි.

(ආ) 2011 ජනවාරි 03 දින සිට කෑගල්ල අධ්‍යාපන කලාපයේ පාසලක සේවය කළ ගුරුවරියක් 2012, 2013 හා 2014 වර්ෂ සඳහා පිළිවෙලින් දින 29 ක් , දින 154 ½ ක් හා දින 82 ක් වැටුප් රහිත නිවාඩු ලබාගෙන ඇතත් ඒවා අයකර ගැනීමකින් තොරව 2015 මාර්තු මාසයේ සිට බස්නාහිර පළාතට ස්ථාන මාරු කර තිබුණි.

(ඇ) සබරගමුව පළාත් මාර්ග සංවර්ධන අමාත්‍යාංශය විසින් 2015 වර්ෂය තුල ක්‍රියාත්මක කර තිබු ව්‍යාපෘති 04 කට අදාල බිල්පත් සමඟ ඉදිරිපත් කර තිබු මිනුම් වාර්තා සහ භෞතික පරීක්ෂාවේ දි ලබා ගත් මිනුම් අනුව විෂමතාවයක් පැවැති අතර, ඒ අනුව රු.61,294 ක් අදාල කොන්ත්‍රාත්කාර සමිතිවලට වැඩිපුර ගෙවා තිබුණි. 2015 වර්ෂය තුල ක්‍රියාත්මක කර තිබු ව්‍යාපෘති 04 ක වැඩ අවසන් කළ යුතු නියමිත දිනයේ දී වැඩ අවසන් කර නොතිබීමෙන් අදාල ව්‍යාපෘති සති 03 සිට සති 54 දක්වා කාලයක්

ප්‍රමාද වී තිබූ අතර, එකතුව රු.239,590 ක ගනුදෙනු බේරුම් කිරීමේ අලාභයක් අයකර ගත යුතුව තිබුණි.

(ඇ) අටුළුගම අධ්‍යාපන සංවර්ධන පුහුණු මධ්‍යස්ථානයේ 2015 දෙසැම්බර් 08 දින කාර්මික නිළධාරි සමඟ හා 2016 ජනවාරි 29 දින දිස්ත්‍රික් විෂය භාර කෘෂිකර්ම නිළධාරි සමඟ සිදුකරන ලද වැඩබිම් පරීක්ෂාවේදී ඇස්තමේන්තුවේ සඳහන්වූ ඇතැම් වැඩ කොටස් ඉටුකර නොමැති බව නිරීක්ෂණය විය. කොන්ත්‍රාත්කරු වෙත ගෙවීම් කිරීමට පෙර පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂගේ හෝ භූමි අලංකරන කටයුතු පිළිබඳ වෘත්තිමය නිපුණතාවයක් සහිත නිළධාරියකුගේ හෝ නිර්දේශයක් ලබා නොගෙන වැඩ අවසන් වාර්තාව මත එකතුව රු.1,769,174 ක මුදලක් ගෙවීම් කර තිබුණි. අඩුපාඩු පැවතියදී සම්පූර්ණ කොන්ත්‍රාත් වටිනාකම ගෙවීම හේතුවෙන් රු.323,002 ක මුදලක් වැඩිපුර ගෙවා ඇති බව විගණනයේ දී නිරීක්ෂණය විය.

**6.9 <u>කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු</u>**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පළාත් මාර්ග සංවර්ධන අමාත්‍යාංශය විසින් 2015 වර්ෂය තුල ව්‍යාපෘති 1106 ක් ක්‍රියාත්මක කිරීම සඳහා රු.1,303,511,189 ක මුදලක් ප්‍රතිපාදනය කර තිබුණ ද ඉන් රු.237,829,143 ක් වටිනා ව්‍යාපෘති 261 ක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය මගින් ලබා දුන් අරමුදල් මගින් පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය යටතේ රත්නපුර දිස්ත්‍රික්කයේ පල්ලෙබැද්ද බුළුතොට මාර්ගය සංවර්ධනය සඳහා 2011 දෙසැම්බර් 05 දින ප්‍රධාන ලේකම් විසින් පුද්ගලික සමාගමක් සමග ගිවිසුමකට එළැඹ තිබුණි. එම ගිවිසුම අනුව වැඩ අවසන් කළ යුතු දිනය 2013 අප්‍රේල් 04 වූ අතර, නියමිත දිනට වැඩ අවසන් කිරීමට අපොහොසත් වීම නිසා අවස්ථා 4ක දී දින 558 ක් කාලය දිර්ඝ කර තිබුණි. කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසිවල දක්වා ඇති දින දීර්ඝ කිරීම් සඳහා සලකා බැලිය යුතු කරුණු වලට පටහැනිව හා කිසිදු නිශ්චිත හා සාධාරණ පදනමක් රහිතව දින 323 ක කාලය දීර්ඝ කිරීම් ලබා දී තිබූ බවත්, එම කාලය වෙනුවෙන් අතිරේකව දැරීමට සිදු වූ පොදු කාර්ය වියදම් , මිල විචලතා මෙන්ම, අයකරගත හැකි වූ ප්‍රමාද ගාස්තු අහිමි වීමෙන් රජයට සිදු වූ සමස්ත පාඩුව රු.37,132,054 ක් විය.

**6.10 <u>ප්‍රමාද වූ ව්‍යාපෘති</u>**

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

(අ) අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු 04 ක් විසින් ක්‍රියාත්මක කරනු ලබන ඉදිකිරීම් කොන්ත්‍රාත් 147 ක් විවිධ හේතූන් නිසා ප්‍රමාද වී තිබූ අතර, අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු 02 ක ඉදිකිරීම් කොන්ත්‍රාත් 146 ක් ආරම්භ නොකර සම්පූර්ණයෙන්ම අත්හැර දමා තිබුණි.

(ආ) කලවාන මූලික රෝහලේ නිල නිවස අළුත්වැඩියා කිරිමට රු.1,399,015 ක ඇස්තමේන්තුවක් මත 2015 ජුනි මස දි කලවාන විධායක ඉංජිනේරු වෙත ලබා දී තිබූ නමුත් විගණිත දින වූ 2016 පෙබරවාරි 10 දින වන විටත් වහලය පමණක් සාදා තිබුණි. අළුත්වැඩියාව ප්‍රමාද වීම හේතුවෙන් 2016 පෙබරවාරි මාසය දක්වා නිවාස කුලි වශයෙන් රු.116,000 ක වියදමක් දරා තිබුණි.

**6.11 <u>කාර්ය මණ්ඩල පරිපාලනය</u>**

**6.11.1 <u>අධ්‍යාපන ක්ෂේත්‍රයේ කාර්ය මණ්ඩල අතිරික්තතා හා ඌනතා</u>**

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් සබරගමුව පළාතේ පාසල් වල වර්තමාන ගුරු අවශ්‍යතාවයන් සලකා සකස් කර තිබූ යෝග්‍ය ගුරු සංඛ්‍යාව සමඟ සැසඳිමේදී විවිධ විෂයයන් සම්බන්ධයෙන් ගුරු ඌනතා සහ අතිරික්තතා පැවති අතර, විස්තර පහත දැක්වේ.

**6 ශ්‍රේණිය සිට 11 ශ්‍රේණිය දක්වා**

| විෂයය | ඌනතාවය - කළාප සංඛ්‍යාව | ඌනතාවය - ගුරු භවතුන් සංඛ්‍යාව | අතිරික්තය - කළාප සංඛ්‍යාව | අතිරික්තය - ගුරු භවතුන් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ඉංග්‍රීසි | 07 | 161 | 07 | 82 |
| තාක්ෂණ විෂයය | 07 | 633 | 07 | 52 |
| වෙනත් විෂයයන් | 07 | 1929 | 07 | 518 |

**12 ශ්‍රේණිය සිට 13 ශ්‍රේණිය දක්වා**

| විෂයය | ඌනතාවය - කළාප සංඛ්‍යාව | ඌනතාවය - ගුරු භවතුන් සංඛ්‍යාව | අතිරික්තය - කළාප සංඛ්‍යාව | අතිරික්තය - ගුරු භවතුන් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| විද්‍යා හා අතිරේක විෂයයන් | 07 | 81 | 07 | 42 |
| කලා- වාණිජ විෂයයන් | 07 | 70 | 07 | 206 |
| තාක්ෂණ විෂයයන් | 07 | 35 | 02 | 3 |

### 6.11.2 ගුරුවරු අතිරික්තය හා ඌනතාවය, අනුයුක්ත කිරීම

මේ සම්බන්ධයෙන් පහත කරුණු වැඩිදුරටත් නිරීක්ෂණය විය.

(අ) මාවනැල්ල අධ්‍යාපන කළාපයේ පාසල් 39 ක විදුහල්පති තනතුර පුරප්පාඩු වී පැවතීම හේතුවෙන් වර්ෂ 01 සිට 09 දක්වා කාලයක් ගුරු සේවයේ ගුරුභවතුන් විදුහල්පති තනතුරේ වැඩ ආවරණය කර තිබුණි. එමෙන් ම කළාපයේ පාසැල් සඳහා ගුරු භවතුන් අනුයුක්ත කිරීමේ විෂමතාවක් පැවති අතර, පාසල් 14 ක් සඳහා අනුමත ගුරු සංඛ්‍යාව 315 දෙනෙකු වුවත්, 406 දෙනෙකු අනුයුක්ත කර තිබීමෙන් 91 දෙනෙකුගේ අතිරික්තයක් පැවතුණි. පාසල් 15 ක් සඳහා අනුමත ගුරුභවතුන් සංඛ්‍යාව 320 දෙනෙකු වුවත්, 227 දෙනෙකු පමණක් අනුයුක්ත කිරීමෙන් ගුරු භවතුන් 93 දෙනෙකුගේ ඌනතාවයක් ද පැවැතුණි.

(ආ) 2007 දෙසැම්බර් 13 දිනැති අංක 2007/20 දරන අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛය පරිදි ගුරුභවතුන්ගේ සේවා කාලය එක් පාසලක වසර 08 කට සීමා කළ යුතු වුවද, ඊට පටහැනි ලෙස මාවනැල්ල කළාපය තුළ පාසල් 129 ක වසර 08 සිට වසර 36 දක්වා එක ම පාසලේ සේවය කරන ගුරුභවතුන් 1295 දෙනෙකු සිටි බව නිරීක්ෂණය විය.

(ඇ) කෑ/වළගම්බා විද්‍යාලයේ අනුමත ගුරු සංඛ්‍යාව 26 දෙනෙකු වුවත් 36 දෙනෙකු අනුයුක්ත කර තිබුණි. අතිරික්ත ගුරුවරුන් 10 දෙනා පිළිබඳව 2014 සැප්තැම්බර් 12 දින නියෝජ්‍ය විදුහල්පතිවරයා විසින් දැනුම් දී තිබුණ ද ඒ පිළිබඳව කලාප අධ්‍යාපන කාර්යාලය කිසිදු පියවරක් ගෙන නොතිබුණි. ගුරුවරුන් 06 දෙනෙකු සඳහා 2015 වසර කාල සටහන් ලබා දී නොතිබු අතර, විදුහල්පතිවරයා එම ගුරුවරුන්ට ලබා දී තිබු උපදෙස් අනුව ද ඔවුන් කටයුතු කර නොතිබුණි.

(ඇ) 2007 දෙසැම්බර් 20 දිනැති අංක 2007/20 දරන අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛයේ විධි විධානවලට පටහැනිව දෙහිඕවිට අධ්‍යාපන කළාපයේ පළාත් සභා පාසල් 181 ක වසර 09 සිට වසර 28 දක්වා ස්ථාන මාරු නොලබා එකම පාසලේ සේවය කළ ගුරුභවතුන් 922 දෙනෙකු සිටී බව නිරීක්ෂණය විය.

### 6.11.3 <u>සෞඛ්‍ය ක්ෂේත්‍රයේ කාර්ය මණ්ඩල අතිරික්තතා හා ඌනතා</u>

සෞඛ්‍ය ක්ෂේත්‍රයේ එක් එක් සේවාවල සේවක අතිරික්තය හෝ ඌනතාවය, විවිධ ආයතන මට්ටමින් පහත දැක්වේ.

| | පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය | | රත්නපුර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය සහ රත්නපුර දිස්ත්‍රික්කයේ පළාත් රෝහල් | | කෑගල්ල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය සහ කෑගල්ල දිස්ත්‍රික්කයේ පළාත් රෝහල් | |
|---|---|---|---|---|---|---|
| | අතිරික්තය | ඌනතාවය | අතිරික්තය | ඌනතාවය | අතිරික්තය | ඌනතාවය |
| වෛද්‍ය | - | 09 | 02 | 102 | - | 40 |
| හෙද | - | 01 | 18 | 75 | 66 | 18 |
| ඖෂධවේදී | - | - | - | 10 | - | 10 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| මහජන සෞඛ්‍ය පරීක්ෂක | - | 01 | - | 37 | - | 06 |
| පවුල් සෞඛ්‍ය සේවක | - | - | - | 121 | - | 87 |
| ඖෂධ සංයෝජක | - | - | - | 53 | - | 30 |
| උපස්ථායක | - | - | - | 56 | - | 37 |
| රියදුරු | - | 06 | - | 26 | - | 15 |
| අරක්කැමි | - | 02 | 01 | 19 | - | 11 |
| මුරකරු | - | 0 | - | 51 | - | 21 |
| මෝචරි කම්කරු | - | 0 | - | 54 | - | 30 |
| ගණකාධිකාරි | - | 01 | - | 0 | - | 20 |
| වෛද්‍ය රසායනාගාර ශිල්පි | - | 01 | - | 18 | - | 08 |
| කළමනාකරණ සහකාර | - | 04 | - | 07 | - | - |
| සංවර්ධන නිලධාරි | - | 10 | 06 | 38 | - | 30 |
| සෞඛ්‍ය කාර්ය සහයක | - | 16 | 08 | 102 | 131 | 57 |
| මහජන සෞඛ්‍ය ක්ෂේත්‍ර නිලධාරි | 01 | - | - | - | 12 | - |
| කාර්යාල කාර්ය සහයක | - | 05 | - | 10 | - | 05 |
| | --- | --- | --- | ---- | ---- | ---- |
| එකතුව | <u>01</u> | <u>56</u> | <u>35</u> | <u>779</u> | <u>209</u> | <u>425</u> |

මේ සම්බන්ධයෙන් පහත කරුණු වැඩිදුරටත් නිරීක්ෂණය විය.

(අ) උඩුගොඩ රෝහලේ වසර 05 සිට වසර 31 දක්වා කාලයක් සේවයේ යෙදුනු සේවකයින් 28 දෙනෙකු සිටි අතර ඔවුන්ට ස්ථාන මාරුවීම් ලබා දී නොතිබුණි.

(ආ) මූලික රෝහල් 03 ක , දිසා රෝහල් 02 ක, ග්‍රාමීය රෝහල් 05 ක, මධ්‍යම බෙහෙත් ශාලා 14 ක, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාල 07 ක, එක් වතු රෝහලක , ලය චිකිත්සාගාරයේ හා හෙම්මාතගම පර්යන්ත රෝහලේ සෞඛ්‍ය කාර්ය සහායක (කණිෂ්ඨ) අනුමත කාර්ය මණ්ඩලය 175 ක් වුවත්, එම ප්‍රමාණය ඉක්මවා සේවකයින් 172 ක් සේවයේ යොදවා තිබුණි.

(ඇ) කිතුල්ගල දිසා රෝහල් කාර්ය මණ්ඩලයේ නිලධාරින් හා සේවකයින් 28 දෙනෙකු වසර 12 සිට වසර 34 ක කාලයක් ස්ථාන මාරු වීම් නොලබා සේවයේ යොදවා තිබුණි.

## 6.12 <u>ඖෂධ කළමනාකරණය</u>

රත්නපුර ප්‍රාදේශීය සෞඛ්‍ය ඒකකයට අදාලව පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රත්නපුර ප්‍රාදේශීය ඖෂධ සැපයුම් ඒකකයෙහි වාර්ෂිකව නිකුත් කිරීම් සඳහා අවශ්‍ය තොග ප්‍රමාණය වර්ෂය ආරම්භයේ දී පැවතුණ ද ඖෂධ අයිතම 24 කට අදාලව අනවශ්‍ය පරිදි තොග ඇනවුම් කර තිබුණි. ඒ අනුව වටිනාකම රු.3,563,168 ක ඖෂධ තොගයක් වර්ෂ අවසානයේ ගබඩාවෙහි ඉතිරිව පැවති බව නියැදි පරීක්ෂාවේ දි නිරීක්ෂණය විය.

(ආ) පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය මගින් පත් කළ භෞතික තොග සමීක්ෂණ මණ්ඩලය විසින් 2015 දෙසැම්බර් 31 දිනට සකස් කරන ලද භෞතික තොග සමීක්ෂණ වාර්තාවට අනුව රු.7,754,483 ක වටිනාකමින් යුත් ඖෂධ අයිතම 73 ක තොගයක් හා වටිනාකම විගණනයට ඉදිරිපත් නොකළ ඖෂධ තොග අයිතම 41 ක් කාලය ඉකුත් වී තිබුණි.

(ඇ) තත්ත්වයෙන් බාල ඖෂධ සඳහා වන තොග ලෙජරය අනුව 2014 හා 2016 යන වර්ෂයන්හි ඖෂධ වර්ග 18 කට අදාලව රු.22,707,344 ක් වටිනා ඖෂධ තොග හා වටිනාකම සොයා ගත නොහැකි ඖෂධ අයිතම 03 කට අදාල තොග තිබුණි.

(ඇ) 2016 පෙබරවාරි 26 දින තෝරා ගත් ඖෂධ අයිතම 92 කට අදාලව භෞතික තොග පරීක්ෂාවේ දී ලෙජරය අනුව ශේෂය හා භෞතික තොගය අතර ඖෂධ අයිතම 07 ක් සම්බන්ධයෙන් රු.288,092 ක ඌණතාවයක් හා ඖෂධ අයිතම 20 ක් සම්බන්ධයෙන් රු.190,470 ක අතිරික්තයක් නිරීක්ෂණය විය.

(ඉ) එක් එක් රෝහල්, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාල ඇතුළු අනෙකුත් ආයතන වෙත ඖෂධ තොග නිකුත් කිරීමේ දි එම ආයතන විසින් අවශ්‍ය ඖෂධ පිළිබඳව අදාල තොරතුරු (එනම් ඖෂධයේ නම, SR අංකය, දැනට ගබඩා තුළ තිබෙන ප්‍රමාණය, අවශ්‍ය ප්‍රමාණය ) සඳහන් කරමින් වගකිව යුතු නිලධාරියෙකුගේ නිර්දේශය සහිතව ඖෂධ නිකුත් කිරීම් සිදුකළ යුතු විය. එසේ වුවත්, නිර්දේශ රහිතව ලැබෙන ලිඛිත ඇනවුම් සහ දුරකථනය මඟින් සිදුකරන ඇනවුම් සඳහා ඖෂධ නිකුත් කිරීම් 2015 වර්ෂය තුළ නිරන්තරයෙන් සිදු වී ඇති විගණනයේ දි නිරීක්ෂණය විය.

## 6.13 <u>බැංකු සැසඳුම්</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පළාත් සභාව යටතේ වූ විවිධ ආයතනවලින් නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ මාස 06 ක කාලයක් ඉක්මවූ එකතුව රු.9,781,771 ක් වූ චෙක්පත් 243 ක් සම්බන්ධයෙන් සබරගමුව පළාත් මූල්‍ය රීති 283.4 ප්‍රකාරව කටයුතු කර නොතිබුණු අතර, මාස 06 ක කාලයක් ඉක්මවා උපලබ්ධි නොවූ එකතුව රු.1,557,326 ක් වූ තැන්පතු සම්බන්ධයෙන් පසුවිපරම් කටයුතු කර නොතිබුණි.

(ආ) බැංකු ගිණුම් 12 කට අදාල හඳුනා නොගත් හර කිරීම්වල එකතුව රු.1,192,177 ක් වූ අතර, බැංකු ගිණුම් 10 කට අදාලව හඳුනා නොගත් බැර කිරීම්වල එකතුව රු. 4,736,240 ක් විය.

## 6.14 <u>වාහන උපයෝජනය</u>

පහත සඳහන් නිරීක්ෂණය කරුනු ලැබේ.

2006 මාර්තු 18 දිනැති අංක සීඑස්ඒ/පී1/40 දරණ රාජ්‍ය වියදම් කළමනාකරණය චක්‍රලේඛයේ සහ 2006 ඔක්තෝබර් 23 දිනැති අංක සීඑස්ඒ/පී1/40 දරණ අතිගරු ජනාධිපතිතුමාගේ ලිපිය ප්‍රකාරව ප්‍රධාන අමාත්‍යවරයාට නිල වාහන දෙකක් සහ එක් ආරක්ෂක රථයක් පමණක් වෙන් කළ යුතුව තිබුණි. එසේ වුවත් එම විධිවිධාන වලට පටහැනිව 2015 වර්ෂයේ දී වාහන 14 ක් ප්‍රධාන අමාත්‍යවරයා විසින් භාවිතා කර තිබු අතර, එම වාහන නඩත්තු කිරීම සහ අළුත්වැඩියා කටයුතු වෙනුවෙන් 2015 වර්ෂයේ දී ප්‍රධාන අමාත්‍යාංශය විසින් රු.9,394,883 ක් වැය කර තිබුණි.

## 6.15 <u>වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සබරගමුව පළාතට අයත් පාසැල් 1133 අතරින් 2013 වර්ෂය වෙනුවෙන් භාණ්ඩ සමීක්ෂණ සිදුකර තිබු පාසැල් සංඛ්‍යාව 175 ක් පමණක් වූ අතර 2014 වර්ෂය සඳහා එය 164 ක් පමණක් විය.

(ආ) දෙහිඕවිට කළාපයේ පාසැල් 25ක කිසිදු වර්ෂයක භාණ්ඩ සමීක්ෂණයක් සිදු කර නොතිබුණු අතර පාසැල් 17 ක 1994 වර්ෂයෙන් පසුව ද පාසැල් 15 ක 1995 වර්ෂයෙන් පසුව ද භාණ්ඩ සමීක්ෂණ සිදුකර නොතිබුණි.

(ඇ) නිවිතිගල, බලංගොඩ, ඇඹිලිපිටිය, කෑගල්ල, මාවනැල්ල යන අධ්‍යාපන කළාප 05ට අයත් පාසල් 230 ක 2010 වර්ෂයෙන් පසු සමාලෝචිත වර්ෂය දක්වා භාණ්ඩ සමීක්ෂණයන් සිදු කර නොතිබුණි.

(ඈ) සබරගමුව පළාතේ පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව යටතේ පවතින පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට අයත් ආයතන 17 න් 11 ක් ද රත්නපුර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට අයත් ආයතන 108 න් 20 ක් ද 2014 වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණය සිදුකර කර නොතිබුණි.

## 7. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 7.1 ක්‍රියාකාරී සැලැස්ම

ආයතන 05 ක් විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ක්‍රියාකාරි සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

### 7.2 විගණන හා කළමනාකරණ කමිටු

සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු 10 ක් එක් විගණන හා කළමනාකරණ කමිටුවක් බැගින් ද දෙපාර්තමේන්තු 12 ක් විගණන හා කළමනාකරණ කමිටු 02 බැගින් ද අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු 02 ක් විගණන හා කළමනාකරණ කමිටු 03 බැගින් ද පවත්වා තිබූ අතර, අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු 02 ක් සම්බන්ධයෙන් කිසිදු කමිටුවක් හෝ පවත්වා නොතිබුණි.

### 7.3 ප්‍රසම්පාදන සැලැස්ම

අමාත්‍යාංශ 02 ක් විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

### 7.4 නොවිසඳී ඇති විගණන ඡේද පිළිබඳ නිරීක්ෂණ

පළාත් ගිණුම් කාරක සභාවේ සාකච්ඡා කරන ලද 2002 වර්ෂයේ සිට 2005 වර්ෂය දක්වා වූ වර්ෂ 04 ට අදාළ විගණකාධිපති වාර්තාවන් හි ඇතුළත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු 05 කට අදාළ විගණන ඡේද 68 ක් සම්බන්ධයෙන් අදාළ නිවැරදි කිරීමේ කටයුතු සිදුකර නොතිබුණි.

## 8. පද්ධති හා පාලන

විගණනයේ දී නිරීක්ෂණය වූ අඩුපාඩු පිළිබඳව වරින් වර සබරගමුව පළාත් සභාවේ ආයතන ප්‍රධානීන් හා ප්‍රධාන ලේකම්වරයා දැනුවත් කරන ලදි. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය හා මුල්‍ය පාලනය.
(ආ) ආදායම් කළමනාකරණය.
(ඇ) වත්කම් හා මානව සම්පත් පාලනය.
(ඈ) කොන්ත්‍රාත් පරිපාලනය.
(ඉ) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
(ඊ) පාසල් කළමනාකරණය.
(උ) රෝහල් කළමනාකරණය.